# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2064/54 - 2018 අප්‍රේල් මස 01 වැනි ඉරිදා - 2018.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත

10 (1) (ආ) (x) යටතේ නිවේදනය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (x) උපඡේදය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දිසානායක මුදියන්සේලාගේ ලලිත් අයිවන් දිසානායක වන මම යම් තැනැත්තෙකුගේ ආදායම ගණනය කිරීමේදී අඩු නොකළ යුතු බදු සහ වෙනත් අයකිරීම් පහත උපලේඛනය මඟින් මෙයින් නිශ්චය කරමි.

ඩී. එම්. එල්. අයි. දිසානායක,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2018 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ 02,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

**තැනැත්තෙකුගේ ආදායම ගණනය කිරීමේදී අඩු නොකළ යුතු වන බදු සහ වෙනත් අයකිරීම් :**

I. ද්විත්ව බදු ගෙවීම් වැළැක්වීම පිණිස ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඇති කර ගනු ලැබූ ගිවිසුමක් වලංගුව ඇති යම් රටක ආදායම් බද්ද, අති බද්ද, අධි බද්ද හෝ ඒ බදුවලට සමාන ස්වභාවයක යම් බද්දක් (81 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව ශ්‍රී ලංකාවේ ආදායම් බද්ද සම්බන්ධයෙන් බැර කිරීමට ඉඩ හරිනු ලැබූ උපරිම මුදල ඉක්මවන එම ආදායම් බද්ද හෝ අති බද්ද හෝ අධි බද්ද හෝ ඒ බදුවලට සමාන ස්වභාවයක යම් බද්දක් හැර) හෝ

II. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත යටතේ අය කරන ලද යම් ආර්ථික සේවා ගාස්තුවක් ; හෝ

III. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ III A පරිච්ඡේදය යටතේ අයකරනු ලබන මූල්‍ය සේවා මත වූ එකතු කළ අගය මත බද්දක් හා 2009 අංක 09 දරන ජාතිය ගොඩනැඟීමේ බදු පනතේ විධිවිධාන යටතේ අයකරනු ලබන මූල්‍ය සේවා මත වූ ජාතිය ගොඩනැඟීමේ බද්දක් ; හෝ

IV. 2013 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටසේ 14 වන වගන්තිය යටතේ අයකරනු ලබන බෝග රක්ෂණ බද්දක් ; හෝ

V. 2015 අංක 10 දරන මුදල් පනතේ විධිවිධාන යටතේ පනවා අයකර ගනු ලබන සුපිරි ලාභ බද්ද, මත්පැන් අලෙවිහල් සහ තැබෑරුම් අය බද්ද, කැසිනෝ කර්මාන්ත අය බද්ද, ජංගම දුරකථන ක්‍රියාකරු අය බද්ද, චන්ද්‍රිකා ස්ථාන අය බද්ද, ක්‍රීඩා සඳහා වෙන්වූ නාලිකා අය බද්ද සහ මන්දිර බද්ද.

05 - 185

1A - PG 4012 — 432 (2018/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.